# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය (බාහිර) - 2012**
**2015 මාර්තු - මැයි**

**මානවශාස්ත්‍ර පීඨය**

**බෞද්ධ සංස්කෘතිය - BUCU E 2015**

**බෞද්ධ කලා, පුරාවස්තු හා භික්ෂු භික්ෂුණී සංස්ථා**

**කොටස් දෙකෙන් ම ඇතුලත් වන පරිදි ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.**

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි** **කාලය : පැය 03 යි**

---

### 1 කොටස

01. පැවිද්දේ මූලික අරමුණ වූ රුක්ඛමූල සේනාසනය පංචලෙන් අනුමැතිය දක්වා වර්ධනය වීමට බල පෑ හේතු සාධක විමර්ශනය කරන්න.

02. අනේපිඬු සිටුතුමා විසින් බුද්ධ ප්‍රමුඛ සංඝයා උදෙසා පූජා කරන ලද ජේතවනාරාමයේ විවිධ ආරාමික අංග හා එහි වාස්තු විද්‍යාත්මක ලක්ෂණ මූලාශ්‍රය ඇසුරින් පරීක්ෂා කරන්න.

03. භාරතීය බෞද්ධ ස්තූපය හා ලක්දිව පැරණි බෞද්ධ ස්තූපයේ සමවිෂමතා සනිදර්ශිතව පරීක්ෂා කරන්න.

04. ශ්‍රී ලාංකේය බුද්ධ ප්‍රතිමාවේ ආරම්භය, සංවර්ධනය හා එහි සුවිශේෂතා ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය ඇසුරින් ප්‍රකට කරන්න.

05. සඳකඩ පහනේ ආරම්භය, විකාශය හා එහි සංකේතාර්ථ පිළිබඳ විද්වත් මත ගෙනහැර දක්වන්න.

### 11 කොටස

06. බුද්ධ කාලීන භික්ෂු සංස්ථාවේ ප්‍රභවය හා විකාශය ත්‍රිපිටක මූලාශය ඇසුරින් සමාලෝචනය කරන්න.

07. ක්‍රි. පූ. හයවන සියවසේ භාරතයේ පැවති ආගමික, සාමාජික පසුබිම භික්ෂුණී සංස්ථාවේ ප්‍රභවය හා විකාශය කෙරෙහි බලපෑ ආකාරය පෙන්වා දෙන්න.

08. ප්‍රව්‍රජ්‍යාපේක්ෂකයන් විෂයෙහි බුදුරදුන් විසින් පණවන ලද සීමා නියමයන්ගේ ඓතිහාසික පසුබිම හා එහි යුක්ති සහගත පදනම පෙන්වා දෙන්න.

09. ආරාමගත භික්ෂුවගේ සාමූහික ජීවිතයේ යහපැවැත්ම සඳහා බුදුරදුන් විසින් අනුදැන වදාළ විනය ශික්ෂා මොනවාදැයි පැහැදිලි කරන්න.

10. භික්ෂූන් උදෙසා විනය නීති පැණවීමට බලපෑ හේතු සාධක පෙන්වා දෙමින් එම පැණවීමේ මූලික අරමුණු මූලාශ්‍රයානුසාරයෙන් විස්තර කරන්න.

*********************************